ජාතික පොලිස් අභ්‍යාස ආයතනය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 විගණන විෂයය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරබවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 69 ඡේදය සමාලෝචිත වර්ෂයේ මැයි සිට නොවැම්බර් දක්වා මිලදීගන්නා ලද රු.7,985,912ක භාවිතයට ගෙන තිබූ වත්කම්වලට අදාළව රු.271,635ක ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන්කර නොතිබුණි.	වත්කම් උපයෝජනය නොවීම නිසා 2024 වර්ෂය තුළදී මෙම වත්කම් ක්ෂයකර නොමැත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 69 ඡේදය ප්‍රකාරව උපයෝජනය කරන ලද වත්කම් ක්ෂය කළ යුතු බව.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 පටහැනිව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි භාණ්ඩාගාර ප්‍රදාන ලෙස ලැබුණු මුදලෙන් ස්ථාවර වත්කම් ලෙස මිලදීගෙන තිබුණු රු.59,471,562ක් විලම්භනයකර තිබුණි.	භාණ්ඩාගාර ප්‍රදාන ලෙස ලැබුණු මුදලින් මිලදීගන්නා ලද ස්ථාවර වත්කම් ඉදිරි කාලපරිච්ඡේදයක් සඳහා භාවිතා කරන බව.	සියලු අදායම් ගිණුම්ගත කළ යුතු බව.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20හි 07 ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ වෙනම හඳුනාගැනීම සිදුකළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ රු.1,607,589කට මිලදීගන්නා ලද පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය	සමාලෝචිත වර්ෂය තුළ රු.1,607,589කට මිලදීගන්නා ලද අධ්‍යයන කළමනාකරණ පද්ධතිය (Learning Management System) වැරදීමකින් මූල්‍ය ප්‍රකාශන තුළ දේපල පිරියත හා උපකරණ	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගනුදෙනු ගිණුම්ගත කළ යුතු බව.

	වත්කම් ලෙස හඳුනාගැනීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.	යටතේ දක්වා ඇති අතර, මින් ඉදිරියට එය නිවැරදිකර අස්පෘශ්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගැනීම සිදුකරන බව.	

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි අලුත්වැඩියා, වාහන අලුත්වැඩියා සහ වෙනත් වියදම් තුළ ඇතුළත් රු.6,311,245ක ප්‍රාග්ධන ස්වභාවයේ වියදම ප්‍රාග්ධනිත කිරීමට කටයුතුකර නොතිබුණි.	වත්කමේ අයිතිය ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සතු නොවන බැවින්, ඊට අදාළව සිදුකරන ලද ගොඩනැගිලි අලුත්වැඩියා හා වාහන අලුත්වැඩියාවන් ප්‍රාග්ධනිත කිරීම සිදුනොකළ බවත්, එම වත්කම්වල අයිතිය ජාතික පොලිස් අභ්‍යාස ආයතනය වෙත පවරාගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු කිරීමටත් කටයුතු කරන බව.	වත්කම්වල අයිතිය ආයතනය වෙත පවරාගෙන ඒවා ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු බව.
(ආ)	ජාතික පොලිස් අභ්‍යාස ආයතනය ඉදිකිරීම් ව්‍යාපෘති 08ට අදාළ රු.1,642,972ක රඳවාගැනීම්, රඳවාගැනීම් ගිණුමක ගිණුම්ගත කිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමක දක්වා තිබුණි.	ආයතනයේ ඉදිකරන ව්‍යාපෘතීන්වලට අදාළ රඳවාගැනීම්, රඳවාගැනීම් ගිණුමක ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	රඳවාගැනීම් අදාළ ගිණුම්වල ගිණුම්ගත කළ යුතු බව.
(ඇ)	ජේසීබී යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා දරන ලද රු.477,800ක මුදල මූල්‍ය ප්‍රකාශන තුළ විද්‍යුත් උපකරණ යටතේ ගිණුම්ගතකර තිබුණි.	ජේසීබී යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට වැය වූ මුදල යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම්ගතකර ඇති අතර, ඉදිරියේදී මෙවැනි වියදම් වාහන අලුත්වැඩියාවන් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	නිවැරදි ගිණුම්වල ගිණුම්ගත කළ යුතු බව.
(ඈ)	මූල්‍ය ප්‍රකාශන තුළ ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.	ඉදිරි වර්ෂයන් තුළදී විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු වියදම් සඳහා වෙන්කිරීම් ගිණුම්ගත කළ යුතු බව.

1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	මු.රෙ.1646	වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශයේ මුල් පිටපත් සෑම මසක් අවසන් වී එළැඹෙන මාසයේ 15 දිනට ප්‍රථම විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත්, ආයතනය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශයේ පිටපත් සෑම මසක් අවසන් වී එළඹෙන මාසයේ 15 දිනට ප්‍රථම විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මු.රෙ. 1646 ප්‍රකාරව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත දිනට ඉදිරිපත් කළ යුතු බව.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය			
	(i) 3.1 වගන්තිය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝ මීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ වාහනයේ එන්ජිම සම්බන්ධව ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, ආයතනයේ වාහන 40ක් සම්බන්ධයෙන් එසේ කටයුතුකර නොතිබුණි.	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ වාහනයේ එන්ජිම සම්බන්ධව ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව ඉන්ධන පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව කටයුතු කළ යුතු බව.
	(ii) 4.1, 4.2, 4.3, 4.4 වගන්ති	වාහනයක අභ්‍යන්තර අලුත්වැඩියාවකදී සුදුසු ගරාජයක් වෙත ගෙන ගොස් ගලවා මිල ගණනය ලබාගෙන එම මිලගණන්වල සාධාරණත්වය සම්බන්ධ	ආයතනයේ පවතින සේවා අවශ්‍යතාවය අනුව වාහන ප්‍රමාදයකින් තොරව අලුත්වැඩියා කිරීමට කටයුතු කිරීම හේතුවෙන්, පොලිස් ප්‍රවාහන කොට්ඨාසයේ	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.1, 4.2, 4.3, 4.4 වගන්ති ප්‍රකාරව

		රාජ්‍ය අංශයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගැනීමෙන් පසු අලුත්වැඩියාව සිදුකළ යුතු වුවත්, අංක 252-6258 දරන ඩබල්කැබ් රථයේ එන්ජිමේ පූර්ණ අලුත්වැඩියාවක් සඳහා මිලගණන් කැඳවීම මගින් අලුත්වැඩියාව සිදුකර රු.1,366,750ක් පෞද්ගලික ආයතනයට ගෙවා තිබුණි.	වාහන අමතර කොටස් නොමැති වන අවස්ථාවලදී එම කොට්ඨාසයේ නිර්දේශ මත ප්‍රසම්පාදන ක්‍රියාවලි හා අදාළ චක්‍රලේඛ හා උපදෙස් මත ලියාපදිංචි පුද්ගලික ගරාජයක් වෙත වාහන යොමුකර අලුත්වැඩියාවන් සිදු කරනු ලබයි. ඒ අනුව 2024.10.27 දිනැති ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මගින් පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ලබාගන්නා ලද තාක්ෂණික ඇගයීම් වාර්තාවක් අනුව මෙම ප්‍රසම්පාදනය සිදුකර ඇති බවත් විගණනය වෙත දන්වා සිටිමි.	කටයුතු කළ යුතු බව.
(ඇ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.2 පරිච්ඡේදය	ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව, රථගාල අලුත්වැඩියාව, යතුරුපැදි නැවතුම හා අබලි භාණ්ඩ ගබඩාව අලුත්වැඩියාව සඳහා රු.8,267,287ක් ගෙවා තිබුණි. මේ නිසා ආයතනයට තරගකාරී ලංසු ඉදිරිපත්වීම මත ලැබිය හැකිව තිබූ මිලෙහි වාසිය ලබාගැනීමට හැකියාව ලැබී නොතිබුණි.	ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ රථගාල අලුත්වැඩියා කිරීම, යතුරුපැදි නැවතුම්පොළ අලුත්වැඩියා කිරීම සහ අබලි භාණ්ඩ ගබඩාව අලුත්වැඩියා කිරීම යන ව්‍යාපෘති 03 එකිනෙකට වෙනස් කාර්යයන් වන බැවින්, එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් වෙන්ව ප්‍රසම්පාදන කාර්යයන් සිදුකර ඇත. තව ද, මෙම ව්‍යාපෘති සඳහා මු.රෙ. 66 ප්‍රකාරව අදාළ වැය විෂයය වෙත ප්‍රතිපාදන මාරුකර ගැනීම සිදුවූයේ 2024 වර්ෂය අවසානයේදී වන බැවින්, තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනයකර ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට කාලය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 පරිච්ඡේදය අනුව කටයුතු කළ යුතු බව.

ප්‍රමාණවත් නොවූ අතර, වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ලංසු කැඳවා, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය යටතේ මෙම ව්‍යාපෘති සිදුකර ඇති බව විගණනය වෙත දන්වා සිටිමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,495,988 අතිරික්තයක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනය 2011 වර්ෂයේදී පනත සම්මතකර එහි 05 වන වගන්තිය ප්‍රකාරව පොලිස් කාර්යය හා නීතිය ක්‍රියාත්මක කිරීමට සෘජුවම අදාළ වන කරුණු පිළිබඳව පර්යේෂණ හා අධ්‍යයන පැවැත්වීමට කටයුතු සිදුකළ යුතු වුවත්, පසුගිය වසර 12ක කාලය තුළ මෙම කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.	2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ 05 වගන්ති ප්‍රකාරව පොලිස් කාර්යය හා නීතිය ක්‍රියාත්මක කිරීමට සෘජුවම අදාළ වන කරුණු පිළිබඳ පර්යේෂණ, අධ්‍යයන පැවැත්වීමට කටයුතු සිදුකළ යුතු වුවත්, මේ වන තෙක් ජාතික පොලිස් අභ්‍යාස ආයතනයට අනුමත කාර්යය මණ්ඩලය බඳවාගෙන නොමැති බැවින්, පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සිදුකිරීම සඳහා යෝග්‍ය කාර්යය මණ්ඩලයක් ආයතනය සතුව නොමැති බැවින්, එම කාර්යයන් මේ වන තෙක් සිදුකිරීමට නොහැකි වී ඇති බව දන්වා සිටිමි.	2011 ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතෙහි 05 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු බව.
(ආ)	පනතේ 6(2) වගන්තිය ප්‍රකාරව තෝරාගත් අධ්‍යයන පාඨමාලා සඳහා ඇතුළත් කරගනු ලබන ශිෂ්‍ය නිලධරයන්ගේ කාර්යක්ෂමතාව ඇගයීමේ කාර්යය සඳහා විභාග	6 (2) (ඇ) තෝරාගත් අධ්‍යයන පාඨමාලා සඳහා ඇතුළත් කරගනු ලබන ශිෂ්‍ය නිලධරයන්ගේ කාර්යක්ෂමතාව ඇගයීමේ	පනතේ 6 (2) (ඇ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඒ) සහ (ඔ) වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු බව.

	පැවැත්වීම, අධ්‍යයන පාඨමාලා සාර්ථක ලෙස අවසන් කිරීමේදී ශිෂ්‍ය නිලධරයන් වෙත සහතික නිකුත් කිරීම සහ එන්පීඒ (ජාතික පොලිස් අභ්‍යාස ආයතනය) යන ශීර්ෂ නාමය ප්‍රදානය කිරීම, අධ්‍යාපන බලධාරීන්ගේ අනුමැතියට යටත්ව පොලිස් කාර්යය සහ නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ විෂයයන් පිළිබඳව ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය සුදුසුකම් ප්‍රදානය කිරීම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ද අදාළ දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයන්හි අනුමැතියට යටත්ව, එම විශ්ව විද්‍යාලයකට අනුබද්ධවීම, ආයතනයේ කර්තව්‍ය පහසු කරවීම සඳහා සභරා සහ වෙනත් ලේඛන පළකිරීම සහ බෙදාහැරීම, ආයතනයේ කාර්යය සඳහා පුස්තකාල, විද්‍යාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම, ආයතනය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මකවීම සඳහා අවශ්‍ය කථිකාචාර්ය තනතුරු සහ වෙනත් තනතුරු ඇති කිරීම හා ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය සේවා නියුක්තිකයන් සහ නියෝජිතයන් පත්කිරීම ආදී බලතල ක්‍රියාත්මක කිරීමට වසර 12ක කාලයක් ගතවී තිබුණ ද, බලතල ක්‍රියාත්මක කිරීමට කටයුතුකර නොතිබුණි.	කාර්යය සඳහා විභාග පැවැත්වීම, ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අධ්‍යයන කළමනාකරණ මණ්ඩල අනුමැතිය අනුව නිසි ක්‍රමවේදයකට සිදුකරනු ලබයි. 6 (2) (ඇ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඒ) සහ (ඔ) වගන්ති ප්‍රකාරව බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	
(ඇ)	ජාතික පොලිස් අභ්‍යාස ආයතනය 2011 නොවැම්බර් 21 දින, 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනත පාර්ලිමේන්තු පනතක් මගින් සම්මතකර තිබූ අතර, පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පිහිටුවනු ලැබිය යුතු අතර, (2) (1) උපවගන්තිය ප්‍රකාරව මෙම ආයතනය සංස්ථාවක් විය යුතු බවට සඳහන්කර තිබුණ ද, 2011 වර්ෂයේ	ජාතික පොලිස් අභ්‍යාස ආයතනය 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පාර්ලිමේන්තු පනත මගින් සම්මතකර තිබූ අතර, ආයතනය සඳහා අවශ්‍ය සුදුසු කාර්යමණ්ඩලය හඳුනාගැනීම, එම කාර්යමණ්ඩල අනුමතකර ගැනීමට කටයුතු කිරීම සහ එම කාර්යමණ්ඩලය සඳහා අදාළ බඳවාගැනීමේ පටිපාටි සකස්කිරීම වැනි කාර්යයන්	වෙනම ආයතනයක් ලෙස කටයුතු කළ යුතු බව.

සිට 2023 වර්ෂය දක්වාම ශ්‍රී ලංකා පොලීසියේ 225 වැයශීර්ෂය යටතේ මූල්‍ය ප්‍රතිපාදන ලැබී ක්‍රියාත්මකව පැවති අතර, පොලිස් අභ්‍යාස ආයතනය වෙනම ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීමට වසර 12ක් ප්‍රමාද වී තිබුණි	සිදුකර ඇති අතර, ශ්‍රී ලංකා පොලීසියෙන් වෙන්ව ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම පෙර වසරවලදී සකස්කර ඇති බවත්, වෙනම අයවැය ප්‍රතිපාදන වෙන්කර ගෙන වෙනම ආයතනයක් ලෙස ක්‍රියාක්මක කිරීමට වසර 12 ක් ගත වී ඇති බව දන්වා සිටිමි.	

3.2 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පොලිස් අභ්‍යාස ආයතනයේ නව පරිපාලන ගොඩනැගිල්ලෙහි ශ්‍රවණාගාරය සඳහා රු.6,547,992ක් වැයකර 2021 දෙසැම්බර් 23 දින භාෂා පරිවර්තන පද්ධතියක් මිලටගෙන ඇති නමුත්, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි.	මෙම අයිතමයන් නව පරිපාලන ගොඩනැගිල්ලෙහි ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව සවිකරන තෙක් එම අයිතමයන් සුරක්ෂිතභාවය සඳහා ගබඩාවේ තැන්පත්කර ඇති බව දන්වා ඇත. නව පරිපාලන ගොඩනැගිල්ලේ සම්මන්ත්‍රණ ශාලාව තුළ ඉඩපහසුකම් නොමැතිවීම හේතුවෙන් කොඩිතුවක්කු දේශණ ශාලාවේ මෙම පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතුකර ඇති අතර, ඊට අදාළ භාෂා පරිවර්ථන කුටි ඉදිකිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර ඇත.	වත්කම් මිලදීගත් අරමුණ වෙනුවෙන් යෙදවිය යුතු අතර, එම වත්කම් නිෂ්කාර්යය නොවීමට වගබලාගත යුතු ය.

3.3 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය සඳහා ආයතනයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා වෙනම අයවැය වාර්තාවක් සකස්කර වෙනම ආයතනයක් ලෙස ක්‍රියාත්මක වී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී පොලිස් දෙපාර්තමේන්තුවේ 225 වැය ශීර්ෂය යටතේ ආයතනය	ජාතික පොලිස් අභ්‍යාස ආයතනය 2023 වර්ෂය වන තෙක්ම ශ්‍රී ලංකා පොලීසිය යටතේ පවත්වාගෙන ගිය ආයතනයක් වන බැවින්, 2024 වර්ෂයේදී ද ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ රාජකාරී කරනු ලබන සියලුම නිලධාරීන්	වෙනම ආයතනයක් ලෙස කටයුතු කළ යුතු බව

	වෙනුවෙන් රු.846,721,983ක් දරා තිබුණි.	ශ්‍රී ලංකා පොලීසියට අනුයුක්ත නිලධාරින් වන අතර, ඔවුන්ට අදාළ සියලු වැටුප් හා දීමනා ගෙවීම් කරනු ලබන්නේ ශ්‍රී ලංකා පොලීසියේ වැයශීර්ෂය යටතේ වේ. තව ද, 2024 වසරේ ජාතික පොලිස් අභ්‍යාස ආයතනයට අනුයුක්තව පැවති සේවාස්ථ පුහුණු කොට්ඨාසය සහ ඊට අනුයුක්ත සේවාස්ථ පුහුණු ඒකක 14කට අදාළ නිලධාරින් 313ක් සඳහා සියලු වැටුප් හා දීමනා ද, එම ඒකකයන්ට අදාළ සියලු පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ද, ශ්‍රී ලංකා පොලීසියේ 225 වැය ශීර්ෂය යටතේ ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මගින් සිදුකරන ලදී. ඒ අනුව ජාතික පොලිස් අභ්‍යාස ආයතනය 2024 වර්ෂයට අදාළව ශ්‍රී ලංකා පොලීසිය 225 වැය ශීර්ෂය යටතේ රු.846,721,983ක් දරා ඇති බව විගණනය වෙත දන්වා සිටිමි.	
(ආ)	පොලිස් අභ්‍යාස විද්‍යාලය වෙත නීත්‍යානුකූල අයිතියක් නොමැතිව පොලිස් දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.31,869,566ක වියදම් දරා තිබුණි.	2024 වර්ෂයේදී ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වෙනම අයවැයක් වෙන් වුව ද, ආයතනයේ සියලු කාර්යයන් පවත්වාගෙන යනු ලැබුවේ ශ්‍රී ලංකා පොලීසිය සතු ගොඩනැගිලි භාවිතා කරමින් වේ. එහි අයිතිය ශ්‍රී ලංකා පොලීසිය සතු වුවත්, ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ කාර්යයන් සඳහා මෙම ගොඩනැගිලි භාවිතා කළ බැවින් සමාලෝචිත වර්ෂයේදී රු.31,869,566ක වියදමක් ජාතික පොලිස් අභ්‍යාස ආයතන වැය ශීර්ෂය යටතේ දැරූ බවත්, මෙම ගොඩනැගිලි වල නිත්‍යානුකූල අයිතිය ජාතික පොලිස් අභ්‍යාස ආයතනය වෙත පවරාගැනීමේ	ඉඩමෙහි සහ ගොඩනැගිල්ලෙහි අයිතිය ලබාගැනීමට කටයුතු කළ යුතු බව.

		හැකියාව පිළිබඳව සලකා බැලීමට කටයුතු කරන බවත් විගණනය වෙත දන්වා සිටිමි.	
(ඇ)	ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ කටයුතු සඳහා පොලිස් දෙපාර්තමේන්තුව සතු වාහන 40ක් ආයතනය වෙත ලබාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ වාහන නඩත්තු වියදම් ලෙස රු.6,409,908ක් ද, වාහන අලුත්වැඩියා ලෙස රු.14,933,543ක් දරා තිබුණ ද, එම වාහනවල අයිතිය ආයතනය සතුව නොතිබුණි.	ආයතනයේ සියලු කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයනු ලැබුවේ ශ්‍රී ලංකා පොලීසිය සතු ජාතික පොලිස් අභ්‍යාස ආයතනයට අනුයුක්ත වාහන භාවිතා කරමින් වේ. එහි අයිතිය ශ්‍රී ලංකා පොලීසිය සතු වුවත්, ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ කාර්යයන් සඳහා මෙම වාහන භාවිතා කළ බැවින් සමාලෝචිත වර්ෂයේදී රු.6,409,908ක් වාහන නඩත්තු වියදම් සඳහා ද රු.14,933,543ක වියදමක් වාහන අලුත්වැඩියාවන් සඳහා ද, ජාතික පොලිස් අභ්‍යාස ආයතන වැයශීර්ෂය යටතේ දැරූ බවත්, මෙම වාහනවල නිත්‍යානුකූල අයිතිය ජාතික පොලිස් අභ්‍යාස ආයතනය වෙත පවරාගැනීමේ හැකියාව පිළිබඳව සලකා බැලීමට කටයුතු කරන බවත් විගණනය වෙත දන්වා සිටිමි.	වාහනවල අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතු බව.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සඳහා තනතුරු 42කින් යුත් අනුමත කාර්යමණ්ඩලය 163ක් වූ අතර, ඉන් තනතුරු 05ක් සඳහා කාර්යමණ්ඩලය 42කට පමණක් බඳවාගැනීමේ පටිපාටිය අනුමත වී තිබුණි. ඉතිරි තනතුරු සඳහා බඳවාගැනීමේ කාර්යයපටිපාටි සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අනුමත වී නොතිබුණි. මේ නිසා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 246ක් පොලිස් අභ්‍යාස ආයතනයට අනුයුක්තව සේවයකර තිබුණි.	ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා වන තනතුරු 42කින් සමන්විත 163දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාදී ඇත. HM 1 – 1, AR 2, AR 1, MM 1-1, JM 1-1, MA 5-1, MA 1-1, MA 1-2, PL2 සහ PL3 දරන තනතුරු සඳහා වන බඳවාගැනීම් පටිපාටි සකස්කර (SOR) අනුමැතිය ලබාගැනීම	බඳවාගැනීමේ කාර්යය පටිපාටි අනුමතකර පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව.

සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් රු.9,756,837 වටිනාකමැති නව පරිපාලන ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය, සම්මන්ත්‍රණ ශාලාව, පිළිගැනීම් අංශය, පන්ති කාමර හා කාර්යාල කාමර ඇතුළු අත්පත්කර ගැනීම සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණි.	අතිරේක ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 100 වෙන්කර ගැනීම 2024 ඔක්තොම්බර් මාසයේ අනුමත විය. නමුත් මෙම රුපියල් මිලියන 100 වියදම් කිරීමට සැලසුම් කර තිබූ ඇතැම් ව්‍යාපෘතීන් සඳහා ප්‍රමාණවත් ප්‍රසම්පාදන කාලයක් නොමැති වීම, තාක්ෂණික වාර්තා ප්‍රතික්ෂේප වීම හා කාලපරිච්ඡේදය තුළදී භාණ්ඩ සපයාගැනීමට නොහැකිවීම වැනි කරුණු හේතුවෙන් එම ප්‍රසම්පාදනයන් සිදුකිරීමට නොහැකි විය. තව ද, මේ වන විට ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සඳහා නව පරිපාලන ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය, සම්මන්ත්‍රණ ශාලාව, පිළිගැනීමේ අංශය, පංති කාමර හා කාර්යාල කාමර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සකස් කර ඇති බව.	ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතු බව.
(ආ)	2024 වර්ෂයේ තුළදී සිදුකරන ලද රු.31,869,566ක වියදම් 2024 වර්ෂය සඳහා පිළියෙලකර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා ජාතික පොලිස් අභ්‍යාස ආයතනය වෙත මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 50ක් වෙන් කර තිබූ අතර, 2024 වර්ෂය තුළදී මු.රෙ. 66 ප්‍රකාරව පුනරාවර්තන වියදම්වලින් රුපියල් මිලියන 100ක් නැවත ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකර	වර්ෂය තුළ සිදුකළ යුතු සියලු කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු බව.

ගන්නා ලදී. මෙම අතිරේක ප්‍රාග්ධන ප්‍රතිපාදන රුපියල් මිලියන 100 වෙන්කර ගැනීම අනුමතකර ගැනීමට හැකි වූයේ 2024 වසරේ ඔක්තෝබර් මාසයේදී ය. නමුත් මෙම රුපියල් මිලියන 100 වියදම් කිරීමට සැලසුම් කර තිබූ ඇතැම් ව්‍යාපෘතීන් සඳහා ප්‍රමාණවත් ප්‍රසම්පාදන කාලයක් නොමැති වීම හේතුවෙන්, එම ප්‍රසම්පාදනයන් සිදුනොකිරීමටත්, ප්‍රමාණවත් ප්‍රසම්පාදන කාලයක් තුළ අවසන්කර ගැනීමට හැකියාව තිබූ ආයතනයට අත්‍යාවශ්‍යව තිබූ ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක කිරීමටත් සිදු වූ බැවින්, 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් වෙනස්ව ඇති බව.